# 5 ශ්‍රේණිය - මව්බස

## කාර්ය පත්‍රිකා අංක - 05
## (ගුරු අත්පොතේ විවිධ පද වර්ග ඇසුරින්)

## ගම්පහ අධ්‍යාපන කලාපය

කාලය පැය - 01

❖ ප්‍රශ්න සියල්ලට ම දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.

**01. පහත දී ඇති වචන අතුරින් නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

i. බුද්දිමත් / බුද්ධිමත්

ii. පරිගනකය / පරිගණකය

iii. සාකච්චා / සාකච්ඡා

iv. සම්බන්ධකම් / සම්බන්දකම්

v. ප්‍රහේළිකාව / ප්‍රහේලිකාව

(ල. 2 × 5)

**02. දී ඇති වචන වල හිස්තැනට අදාල අකුර වරහන තුළින් තෝරා ලියන්න.**

i. රාජ............නිය (දා / ධා)

ii. වි ........... ල (සා / ශා)

iii. සමෘද් .......... මත් (ධි / දි)

iv. ප ......... විඩ (නි / ණි)

v. කාර්යක් .......... ම (ෂ / ශ)

(ල. 2 × 5)

**03. පහත ඒක වචන ක්‍රියාපදයට අදාළ බහු වචන ක්‍රියාපදය හිස්තැනෙහි ලියන්න.**

ලබයි = ..........................................

කළේය = ..........................................

වැටුණේය = ..........................................

දමයි = ..........................................

ගියා ය = ..........................................

(ල. 2 × 5)

ගම්පහ අධ්‍යාපන කලාපය
ප්‍රාථමික අංශය

04. **පහත දී ඇති වාක්‍ය වල ඉරි ඇඳි පදයට ගැළපෙන සමානාර්ථ පදය යොදා වාක්‍ය නැවත ලියන්න.**

i. මෙම පාර නම් ඉතා අබලන් එකකි.

..........................................................................................................

ii. ශ්‍රී ලංකාව කුඩා දූපතකි.

..........................................................................................................

iii. රුදුරු වනසත්තු කැලෑව තුළ සිටිති.

..........................................................................................................

iv. මේ කුඩා පොත ඉතා ආදර්ශවත් එකකි.

..........................................................................................................

v. ඉතා අවාසනාවන්ත පුවතක් ඇසීමට ලැබුණි.

.......................................................................................................... (ල. 2 × 5)

05. **දී ඇති වචනයට අදාළ විරුද්ධාර්ථ පදය ලියන්න.**

i. පිපෙනවා = ........................................

ii. පුරුදු = ........................................

iii. ලස්සන = ........................................

iv. සෙමෙන් = ........................................

v. සුදුසු = ........................................ (ල. 2 × 5)

06. **පහත ඇති වැකි වල අඩංගු යුගල පද තෝරා යටින් ලියන්න.**

i. ළමයි එකතු වී විහිළු තහළු කරමින් සිටියහ.

.......................................................

ii. රාහුල විද්‍යාලයේ සිසු සිසුවියන් ඉදිරිපත් කළ අරුම පුදුම ගෝනිය විශේෂාංගය ඉතා ආකර්ශනීය විය.

.......................................................

iii. දෙමව්පියෝ පාසලේ අස්සක් මුල්ලක් නෑරම පිරිසිදු කිරීමේ කටයුතු වලට නිරත වූහ.

.......................................................

ගම්පහ අධ්‍යාපන කලාපය ප්‍රාථමික අංශය

iv. මේ දිනවල ළමයි කෙළි සෙල්ලම් වල නිරත වන අතර පොත් පත් වලට හිත යොමු නොකරති.

...................................... , ........................................ (ල. 2 × 5)

**07. දී ඇති ප්‍රස්තාව පිරුළු වල හිස්තැනට අදාළ වචනය කොටුව තුළින් තෝරා ලියන්න.**

| |
|---|
| මැෂිමයි<br>නූලයි<br>නඩු<br>නඬු<br>ආඩි<br>ආඬි<br>මාරපන<br>මාරපන්<br>පිහාටු |

i. ඉඳිකටුවයි ..................................... වගේ

ii. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ ............................ තීන්දුව වගේ

iii. ............................... හත්දෙනාගේ කැඳ හැළිය වගේ

iv. කළුවා ................................. ගියා වගේ

v. ඉබ්බාගෙන් .................................. ඉල්ලනවා වගේ

(ල. 2 × 5)

**08. දී ඇති අදහස් ගෙනදෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.**

i. දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.

..........................................................................................................................................

ii. ගැළපෙන අදහස් හා ගතිගුණ තිබීම.

..........................................................................................................................................

iii. අදූරදර්ශී උපදෙස් දීම.

..........................................................................................................................................

(ල. 3 × 3)

**09. හිස්තැනට ගැළපෙන වාක්‍ය කොටුව තුළින් තෝරා ලියන්න.**

i. ඇඟ බේරා ගන්නවා = ......................................................................................

ii. අහසේ මාලිගා තැනීම = ......................................................................................

iii. මුරුංගා අත්තේ තියනවා = ......................................................................................

iv. අබමල් රේණුවක් = ......................................................................................

| |
|---|
| ඉතා ම සුළු ප්‍රමාණයක් හැඟවීමට තියයි / ඉටු නොවන සිහින මැවීමක දී කියයි / තමාට පැවරුණු වගකීමකින් බේරීමේ දී කියයි / රවටනු පිණිස අත්‍යවශ්‍ය ලෙස කරන වර්ණනාවකදී කියයි / දැඩි සේ බියට පත් වූ මොහොතකදී කියයි. |

(ල. 3 × 4)

ගම්පහ අධ්‍යාපන කලාපය ප්‍රාථමික අංශය

**10. හිස්තැනට අදාළ ආප්තෝපදේශය ලියන්න.**

i. උගත් දේ සැමදා රැකෙයි.

.................................................................................................................................

ii. ආරවුලක් තව තවත් ඇවිස්සීම නොකරන්න.

.................................................................................................................................

iii. ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න.

................................................................................................................................. (ල. 3 × 3)

## පිළිතුරු පත්‍රය

### කාර්ය පත්‍රිකා අංක - 05

## ගම්පහ අධ්‍යාපන කලාපය

01. i. බුද්ධිමත් ii. පරිගණකය iii. සාකච්ඡා iv. ප්‍රතිසංස්කරණය v. ප්‍රහේලිකාව

02. i. ධා ii. ශා iii. ධි iv. ණි v. ෂ

03. i. ලබති. ii. කළෝය / කළහ. iii. වැටුණෝය.
iv. දමති. v. ගියෝ ය. / ගිය හ.

04. i. මාර්ගය නම් ඉතා අබලන් එකකි. ii. ශ්‍රී ලංකාව කුඩා දිවයිනකි.
iii. රුදුරු වන සතුන් වනය තුළ සිටිති. iv. මේ කුඩා ග්‍රන්ථය ඉතා ආදර්ශවත් එකකි.
v. ඉතා අවාසනාවන්ත ප්‍රවෘත්තියක් ඇසීමට ලැබුණි.

05. i. පරවෙනවා ii. නුපුරුදු iii. අවලස්සන iv. වේගයෙන් v. නුසුදුසු

06. i. විහිළු තහළු ii. අරුම පුදුම iii. අස්සක් මුල්ලක්
iv. කෙළි සෙල්ලම් / පොත් පත්

07. i. නූලයි ii. නඩු iii. ආඬි iv. මාරපන් v. පිහාටු

08. i. ගඟට ඉනි කැපුවා වගේ. ii. රයිගමයයි ගම්පළයයි වගේ.
iii. මහදැනමුත්තාගේ නුවණ වගේ.

09. i. තමාට පැවරුණු වගකීමකින් බේරීමේදී කියයි.
ii. ඉටු නොවන සිහින මැවීමකදී කියයි.
iii. රවටනු පිණිස අනවශ්‍ය ලෙස කරන වර්ණනාවකදී කියයි.
iv. ඉතා ම සුළු ප්‍රමාණයක් හැඟවීමට කියයි.

10. i. උගත මනා ශිල්පයමයි මතු රැකෙනා. ii. ඇවිළෙන ගින්නට පිඳුරු නොදමන්න.
iii. ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න.